(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 36.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2022 ජූනි 07 අඟහරුවාදා පූ.භා. 10.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

2002/2022

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා,— සංචාරක හා ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වර්ණ භූමි, ජය භූමි, ඉසුරු භූමි හා රන් භූමි ඔප්පු සහිත ඉඩම්වල අයිතිකරු මියගිය පසු ඒවායේ හිමිකාරිත්වය සම්බන්ධයෙන් පවතින නීතිමය තත්ත්වය කවරේද;

(ii) උක්ත ඉඩම්වල පසු අයිතිය පවුලේ වැඩිමහල් දරුවාට පමණක් හිමිවීම හේතුවෙන් ගැටලු රැසක් උද්ගත වී ඇති බව දන්නේද;

(iii) ඔහු විසින් ඉඩමේ අයිතිය සෙසු සහෝදර/සහෝදරියන්ට ලබා දීම ප්‍රතික්ෂේප කළහොත් ඔවුන්ට ලැබෙන නීතිමය රැකවරණය කවරේද;

(iv) ඊට අදාළ නීති සංශෝධනය කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

(vi) උක්ත ඉඩම්වල උරුමය, පවුලේ දරුවන් අතර සමසේ බෙදී යන ආකාරයෙන් අදාළ ඔප්පු සකස් කිරීමට පවතින බාධාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ඉඩම්, කොටස් කිරීමේදී පවතින බෙදුම් සීමාවන්, ගොඩ හා මඩ ඉඩම් අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම බෙදුම් සීමාවන් හේතුවෙන් ගැටලු රැසක් උද්ගත වී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, ඊට අදාළ විසඳුම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2004/2022

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගමේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

2012/2022

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා අනුමත කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරී සහ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී තනතුරු සංඛ්‍යාව;

(ii) එම එක් එක් තනතුරේ මේ වනවිට සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් තනතුරේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා මඟින් ගොවීන්ට තාක්ෂණික උපදෙස් ලබා දීමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එම මධ්‍යස්ථාන මඟින් ගොවීන්ට බීජ වර්ග ලබා දීමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, ලබා ගත හැකි බීජ වර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බීජ ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය වන මුදල කොපමණද;

(ii) දේශීය බීජ වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2040/2022

ගරු මර්ජාන් ෆලීල් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ප්‍රවාහන විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමගින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2043/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාලය තුළ ඉන්දීය ආධාර වැඩසටහන යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ඉදිකරන ලද ප්‍රදේශවල නම් කවරේද;

(iii) එම නිවාසවල පදිංචි වීමට අවශ්‍ය මූලික පහසුකම් තිබේද;

(iv) ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේ සේවය කරන සේවකයන්ට පමණක් ඉහත නිවාස ලබා දීමට තීරණය කර තිබුණේද;

(v) එසේ නම්, එම තීරණය ගන්නා ලද පාර්ශ්වය කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉන්දීය ආධාර යටතේ හෝ වෙනත් වැඩසටහනක් යටතේ මොනරාගල දිස්ත්‍රික්කයේ වතුවල සහ වතු ආශ්‍රිතව ජීවත්වන ජනතාව සඳහා නිවාස ඉදිකර දීමට වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ යටතේ ඉදිකරනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ඉදිකරනු ලබන දින වකවානු කවරේද;

(iv) එම නිවාස, ප්‍රතිලාභින්හට ලබා දෙනු ලබන පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2059/2022

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධූර කාලය;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම්;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම්;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2071/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලය තුළ ස්වාධීන රූපවාහිනී සේවයේ සහ ලක්හඬ ගුවන් විදුලියේ නව ලාංඡන ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලය තුළ ස්වාධීන රූපවාහිනී සේවය සහ ලක්හඬ ගුවන් විදුලිය සඳහා බඳවාගන්නා ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(ii) එම එක් එක් උපදේශකවරයාගේ නම, අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්, ගෙවන ලද මාසික වැටුප, දීමනා හා ලබා දෙන ලද වෙනත් පහසුකම් සහ එම එක් එක් උපදේශකවරයාට ගෙවන ලද සම්පූර්ණ මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත උපදේශකවරුන් විසින් ස්වාධීන රූපවාහිනී සේවයට සහ ලක්හඬ ගුවන් විදුලියට ලබා දෙන ලද සේවය කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2100/2022

ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සහල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සහල් ආනයනය කිරීම සඳහා වැය කරන ලද මුදල ඉහත සඳහන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සහල් ආනයනය කරන ලද ආයතනවල/සමාගම්වල නම් කවරේද;

(iv) එම සහල් ආනයනය කිරීමේදී අයකරන ලද බදු මුදල ඉහත සඳහන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2114/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස් රථ සංඛ්‍යාව;

(ii) මණ්ඩලයේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු මගී ප්‍රවාහන බස් රථ අතරින් මේ වනවිට අධිවේගී මාර්ගවල ධාවනයට යොදවා ඇති බස් රථ සංඛ්‍යාව;

(ii) අධිවේගී මාර්ගවල ධාවනයේ යොදවා ඇති බස් රථ මඟින් ආරම්භයේ සිට මේ දක්වා ලැබූ ආදායම සහ එම බස් රථ වෙනුවෙන් සිදු කර ඇති වියදම වෙන් වෙන් වශයෙන්;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ආදායම සහ වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2022 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා (අංක 1),— 2022 ජුනි 02 දින තේරීම් කාරක සභාව තීරණය කළ පරිදි මතු සඳහන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවන් හි නාමයන්:—

1. මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව "මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව" ලෙසත්;
2. අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව "අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව" ලෙසත්;
3. කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව "කම්කරු හා විදේශ රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව" ලෙසත්;

4. වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව “වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව” ලෙසත්;

5. තරුණ හා ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව “ක්‍රීඩා හා යෞවන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව” ලෙසත්; සහ

6. වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව “වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව” ලෙසත්;

නැවත නම් කළ යුතුය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 (1) හි විධිවිධාන ප්‍රකාරව සහ 2022 ජුනි 02 දින තේරීම් කාරක සභාව තීරණය කළ පරිදි, මතු දැක්වෙන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා පත් කළ යුතු ය:—

1. ප්‍රවාහන හා මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

2. සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

ඉහත එක් එක් කාරක සභාව වෙත යොමු කරනු ලබන කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කර බලා වාර්තා කිරීම සඳහා එම එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, අමාත්‍ය මණ්ඩලයේ අදාළ විෂය භාර අමාත්‍යවරයා සභාපතිවරයා වූ ද, රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන වෙනත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙකුගෙන් (5) සමන්විත විය යුතුය.

ඉහත එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් (3) සංයුක්ත විය යුතුය.

4.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,— පනත් කෙටුම්පතක් ඉල්ලා අස්කර ගැනීමේ අවසරය,— 2022 මැයි 17 දින ඉදිරිපත් කරන ලද පහත පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගැනීමට අවසර දිය යුතුය:—

“ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.”

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු, 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2022 අප්‍රේල් 09 දිනැති අංක 2274/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.05.06 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා,— දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ යෝජනා සම්මතය,— මෙයට පෙර යෝජනා සම්මතයන් මඟින් අවසර දෙන ලද මුදලට වැඩිමනත් වශයෙන් රු.1,000,000,000,000කට නොවැඩි මුදලක් ශ්‍රී ලංකාවේදී ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමෙන් ණයට ගැනීමටත්, එම කාර්යය සඳහා (417 අධිකාරය වන) දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනතේ 2(1) වගන්තිය යටතේ අවශ්‍ය සියලුම අවසර මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට දීමටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ඛනිජතෙල් සම්පත් පනත යටතේ නියෝග,— 2021 අංක 21 දරන ඛනිජතෙල් සම්පත් පනතේ 5(3)(ආ) සහ 30(3) වගන්ති සමඟ කියවිය යුතු 48 වගන්තිය යටතේ බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021 ඔක්තෝබර් 15 දිනැති අංක 2249/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2022.01.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

සත්ව සුබසාධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

9.

ජාත්‍යන්තර සිංහ සමාජ දිස්ත්‍රික්ක 306 ඒ - ජාතික සංවර්ධන පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

10.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

11.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

12.

වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

13.

රොෂාන් රණසිංහ ජනසහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

14.

මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

15.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

16.

සාමය, අධ්‍යාපනය, බලගැන්වීම සහ සංවර්ධනය උදෙසා වූ ක්‍රීඩා ආයතනය (SPEED) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

3339/2022

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගමය විධිමත් ලෙස ගිණුම් පවත්වාගෙන නොයෑම, අදාළ ලිපිලේඛන ඉදිරිපත් නොකිරීම සහ මූල්‍ය අසමතුලිතතා පැවතීම විගණකවරුන් විසින් පෙන්වා දී ඇති බැවින් එම සංගමයේ වංචා හා දූෂණ සිදු වී ඇති බව පිළිගන්නේද;

(ii) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් මේ සම්බන්ධයෙන් අපක්ෂපාතී පූර්ණ විගණනයක් සිදු නොකිරීමට හේතු කවරේද;

(iii) ඉහත සංගමයේ සිදු වී ඇති වංචා හා දූෂණ හේතුවෙන් එම සංගමයට හා එහි සාමාජිකයන්ට අහිමි වී ඇති මුදල ගණනය කොට එම මුදල් ප්‍රතිපූර්ණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් කටයුතු කරන්නේද;

(iv) ඉහත සංගමයේ සිදු වී ඇති වංචා හා දූෂණවලට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

3340/2022

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භාණ්ඩාගාර ලේකම්වරයා විසින් වගකීම් පැහැර හැරීම හේතුවෙන් රජයේ නිලධාරින්ගේ යහසාධක සංගමය පරිහානියට පත් වෙමින් පවතින බව දන්නේද;

(ii) 1971 අංක 27 දරන පනතේ 11 වන වගන්තිය අනුව ඉහත සංගමයට නීත්‍යානුකූල ලේකම්වරයෙකු හා ගණකාධිකාරිවරයෙකු පත් නොකිරීමට හේතු කවරේද;

(iii) තනතුරු හිස්ව තැබීමේ අරමුණින් අනවශ්‍ය සුදුසුකම් සහිතව ඉහත තනතුරුවලට බඳවාගැනීමට ගැසට් නිවේදන පල කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල කාලය 2020.06.30 දිනෙන් අවසන් වූ සංගමයේ පාලක කමිටුව විසින් තවදුරටත් මූල්‍ය හා පරිපාලන තීරණ ගැනීම නීත්‍යානුකූල නොවන බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අදාළ පියවර නොගැනීමට හේතු කවරේද;

(iii) සංගමයේ ලේකම්වරයා සහ වෘත්තීය සමිති අතර 2020.10.16 දින පැවති සාකච්ඡාවේදී නිලවරණයක් පවත්වන තෙක් මූල්‍ය හා පරිපාලන කටයුතු සඳහා නිලධාරියෙකු පත් කිරීමට තීරණය කළ ද, ඒ සම්බන්ධයෙන් පියවර නොගැනීමට හේතු කවරේද;

(iv) වර්තමාන පාලක කමිටුව විසින් සංගමයේ පරිපාලන කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනමින් විශ්‍රාමිකයකු බඳවාගැනීමට හේතු කවරේද;

(v) ඉහත සංගමයේ පරිහානිය සම්බන්ධයෙන් වගකිව යුත්තේ කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?